ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/ii/25/01/23

# මාධ්‍ය නිවේදනය

2023 වර්ෂයේ ජනවාරි මස 23 වන දින සිට පෙබරවාරි මස 17 දින දක්වා අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වෙන කාල සීමාව තුළ අඛණ්ඩව විදුලි බල සැපයුම ලබාදීම සඳහා කටයුතු කිරිමට පහත කරුණු සම්බන්ධව පහත සඳහන් පාර්ශවයන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේදී එකඟ වන ලදී.

අ.පො.ස. (උ.පෙළ) විභාගය පැවැත්වෙන කාල සීමාව තුළ අඛණ්ඩව විදුලිය සැපයීම සඳහා අවශ්‍ය වන ඉන්ධන ලබාදීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට යෝජනාවක් කරනු ලැබිය. ඒ සඳහා වැයවන පිරිවැය අයකර ගැනීමට අවශ්‍ය කොන්දේසි ඉදිරියේදී සිදු කිරීමට යෝජිත විදුලි මිල සංශෝධනයේදී ගෙවිම් කිරිම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු බවට විදුලි බල මණ්ඩලය වෙත මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ. ඒ අනුව අදාළ මුදල් දින 60ක් ඇතුලත ගෙවිමට සියලුම පාර්ශවයන් එකඟතාවය පළකර සිටි.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් මෙම සමථය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධිකරණය හා පහසුකම් සැපයීමට මැදිහත්විය යුතුය.ඒ අනුව අ.පො.ස (උ.පෙළ) විභාගය පැවැත්වෙන කාලය තළ අද දින සිට විදුලිය විසන්ධි නොකිරීමට එකඟවේ.

මේ අවස්ථාවේ මෙම සමථය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශයක් වශයෙන් ඇතුළත් කරනු ලබයි. එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව එකගවේ.

මාධ්‍ය ප්‍රකාශක

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.01.25